සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

22 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018
Second Term Test - Grade 12 - 2018

විභාග අංකය ..............................

# භූගෝල විද්‍යාව I

කාලය පැය දෙකයි

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.**
- **I කොටසේ බහුවරණ ප්‍රශ්න 30 කි. I කොටසට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලිවිය යුතුවේ.**
- **II කොටස ප්‍රශ්න තුනකින් සමන්විතය. ඉන් පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න දෙකක් තෝරා ගත යුතුය.**
- **I හා II කොටස් වලට සපයන ලද පිළිතුරු පත්‍ර එකට අමුණා භාරදිය යුතුය.**


## I කොටස


- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

1. ප්‍රායෝගික භූගෝල විද්‍යා ක්‍රමවේද තොරතුරු සන්නිවේදනයේ දී භාවිතා කරන අවස්ථාවක් වන්නේ මින් කවර පිළිතුරකද?
   i. ලෝක කාලගුණ තොරතුරු සකස් කිරීම.
   ii. මුහුදේ හා ගොඩබිමේ ගමන් කරන්නන්ට ගමන් මාර්ගය සොයා ගැනීමේ දී,
   iii. ගෝලීය, කලාපීය, ස්ථානීය වශයෙන් සිදුවන වෙනස්කම් අධ්‍යයනයේ දී,
   iv. පෘතුවිය මත ඇති මානුෂ පාරිසරික ගැටළු හඳුනා ගැනීමේ දී,
   v. විශාල තොරතුරු ප්‍රමාණයක් දෛනිකව ප්‍රචාරය කිරීමේ දී, (.........)

2. කිලෝමීටර් 2.5ක් දිග මාර්ගයක් 1:50000 භූ ලක්ෂණ සිතියමක නිවැරදිව දැක්වෙන දුර අඩංගු පිළිතුර කුමක්ද?
   i. 4.8 cm කිනි. ii. 5 cm කිනි. iii. 10 cm කිනි.
   iv. 5.5 cm කිනි. v. 12 cm කිනි. (.........)

3. භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන භෞතික ලක්ෂණයක් මෙහි දක්වා ඇත. එහි A සිට B දක්වා හරස්කඩ නිර්මාණය කළ විට ලැබෙන රූපසටහන මින් කුමක්ද?





i. ii. iii. iv. v. (.........)

4. 1:50000 මෙට්‍රික් සිතියමක කිලෝමීටර් 6ක් දිග හා කිලෝමීටර් 4ක් පළල වූ බිම් ප්‍රදේශයක් 1:25000 පරිමාණයෙන් දැක්වූ විට ලැබෙන බිමේ දිග හා පළල වන්නේ මින් කවරක්ද?
   i. සෙ.මී. 24 හා සෙ.මී. 16කි. ii. සෙ.මී. 12 හා සෙ.මී. 8කි.
   iii. සෙ.මී. 6 හා සෙ.මී. 4 කි. iv. සෙ.මී. 3 හා සෙ.මී. 2කි.
   v. සෙ.මී. 1.5 හා සෙ.මී. 1 කි. (.........)

5. මෙට්‍රික් සිතියම්වල භාවිතා වන සංස්කෘතික ලක්ෂණ පමණක් අඩංගු වන පිළිතුර මින් කුමක්ද?

i. ගංගාව, වාරි ඇළ, පාලම  ii. සානුව, වැව, ජලාශය
iii. වැව, දුම්රිය මාර්ගය, වේල්ල  iv. අධිපාර, මහා මාර්ගය, තණබිම
v. වී වගාව, දුම්රිය මාර්ගය, ලඳු කැලෑ (.........)

6. ඉහත සිතියම් ප්‍රදේශයේ AB, CD, EF, GH අක්ෂර වලින් පෙන්නුම් කරන බෑවුම් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.




i. අවතල බෑවුම, මද බෑවුම, උත්තල බෑවුම, දළ බෑවුම
ii. මද බෑවුම, උත්තල බෑවුම, අවතල බෑවුම, දළ බෑවුම
ii. උත්තල බෑවුම, දළ බෑවුම, මද බෑවුම, අවතල බෑවුම
iv. උත්තල බෑවුම, මද බෑවුම, අවතල බෑවුම, දළ බෑවුම
iii. දළ බෑවුම, මද බෑවුම, උත්තල බෑවුම, අවතල බෑවුම
(.........)

7. පෝෂක ප්‍රදේශයක් ගංගා මණ්ඩල දෙකකට වෙන් කරනුයේ,

i. දිය බෙත්ම මගිනි.  ii. ආයතගාමී නිම්නය මගිනි.  iii. අතු ගංගා මගිනි.
iv. ප්‍රධාන ගංගාව මගිනි.  v. තීර්යයක් නිම්නය මගිනි. (.........)

8. භූගෝලීය තොරතුරු පද්ධතියක මූලික සංරචකයක් වන්නේ මින් කුමක්ද?

i. පරිගණකය  ii. ආදාන උපාංග  iii. ප්‍රතිදාන උපාංග
iv. පරිගණක මෘදුකාංග  v. අංකන ඵලකය (.........)

9. සිතියම් නිර්මාණයට අවශ්‍ය දත්ත හා තොරතුරු සම්පාදනය කර ගැනීමේ දුරස්ථ සංවේද ශිල්ප ක්‍රමයක් වන්නේ මින් කුමක්ද?

i. පරිගණක  ii. චන්ද්‍රිකා තාක්ෂණය  iii. තියොඩ ලයිට්ටුව
iv. තිර අංකන ඵලකය  v. චුම්භක තැටි (.........)

10. යම් නගරයක පිහිටීම ඛණ්ඩාංක දත්ත ආකෘතියට අනුව (දෛශික දත්ත) නිර්මාණය කිරීමේ දී භාවිතා කළ හැකි ක්‍රමය මින් කුමක්ද?

i. රේඛා  ii. සනත්ව රටාව  iii. අක්ෂාංශ  iv. දේශාංශ  v. ලක්ෂ්‍ය (.........)

11. වායු ගෝලීය ස්ථර අතරින් උෂ්ණත්වය අඩුම ස්ථරය මින් කවරක්ද?

i. අපරිවර්ති මණ්ඩලය  ii. මෙසෝ ගෝලය  iii. පරිවර්තී ගෝලය
iv. තාප ගෝලය  v. අපරිවර්තී ගෝලය (.........)

12. පෘතුවි අභ්‍යන්තරයට යන විට උෂ්ණත්වය ඉහල යන ප්‍රමාණය දක්වා ඇත්තේ කවර පිළිතුරේ ද?

i. කිලෝමීටරයට $9\,^0C$ කිනි.  ii. කිලෝමීටරයට $0.64\,^0C$ කිනි.
iii. කිලෝමීටරයට $25\,^0C$ කිනි.  iv. කිලෝමීටරයට $6.4\,^0C$ කිනි.
v. කිලෝමීටරයට $0.9\,^0C$ කිනි. (.........)

13. සියල් හා සිමා ස්ථර දෙක වෙන් කරන සීමාව හඳුන්වන්නේ මින් කවර නමකින්ද?

i. මොහොර විසික් අසන්තතික කලාපය  ii. කොන්රඩ් අසන්තතික කලාපය
iii. ලේමන් අසන්තතික කලාපය  iv. ගුටෙන් බර්ග් අසන්තික කලාපය
v. අධෝ ගෝලය (.........)

14. රසායනික වශයෙන් අවක්ෂේප වූ අවසාධිත පාෂාණයක් වන්නේ මින් කුමක්ද?

i. වැලිගල් ii. පීට් iii. ගල් අඟුරු iv ගිනිගල් v. හුණු ගල් (.........)

15. ශ්‍රී ලංකාවේ භූමියේ 90% කට වැඩි ප්‍රමාණයක් අන්තර්ගතව ඇති පාෂාණ වර්ගය හඳුන්වන්නේ,

i. මයෝසීන හුණුගල් ය. ii. ප්‍රාග් ක්‍රේම්බ්‍රීය පාෂාණය iii. ජුරාසික යුගයේ පාෂාණය

iv. පැලියෝසොයික යුගයේ පාෂාණය v. නූතන යුගයේ පාෂාණය (.........)

16. බහිර්ජන්‍ය ක්‍රියාවලි මගින් පෘතුවි තලය ගෙවා දැමීමත්, නිධිගතවීමත් යන ක්‍රියාවලි සිදුවේ. එම ක්‍රියාවලීන් දෙකම හඳුන්වන්නේ,

i. අවක්‍රමණය යනුවෙනි ii. ක්‍රමණය යනුවෙනි. iii. ජීර්ණ ක්‍රියාවලිය යනුවෙනි.

iv. තැම්පත් වීම යනුවෙනි v. උත්ක්‍රමණය යනුවෙනි. (.........)

17. ශ්‍රී ලංකාවේ බොරලැස්ගමුව, මීටියාගොඩ, වස්කඩුව වැනි ප්‍රදේශවල පිහිටා ඇති ලෝහමය නොවන ඛනිජ වර්ගය මින් කුමක්ද?

i. බෝල මැටි නිධි ii. ඇපටයිට් නිධි iii. කෙඔලින් නිධි iv. ෆෙල්ස්පාර් v. මයිකා නිධි (.........)

18. ශ්‍රී ලංකාවේ හඳුනාගත හැකි පාෂාණ අතර කොණ්ඩලයිට් සහ චානොකයිට් පාෂාණ බහුල වශයෙන් ව්‍යාප්ත වී ඇති පාෂාණ කලාපය ඇතුළත් වරණය තෝරන්න.

i. වන්නි සංකීර්ණය ii. විජයානු ශ්‍රේණිය iii. මයෝසීන පාෂාණ කලාපය

iv. උස්බිම් ශ්‍රේණිය v. ජුරාසික පාෂාණ කලාපය (.........)

19.



i. ii. iii.

ඉහත රූප සටහන්වල දැක්වෙන භූ තැටි චලන ක්‍රියාකාරීත්වය නිසා නිර්මාණය වන භූ රූප 03ක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර නම් කරන්න.

i. නැමිකඳු, විභේද, සානු ii නැමිකඳු, විභේද, මධ්‍යසාගරික වැටි

iii. මධ්‍යසාගරික වැටි, නැමි කඳු, විභේද iv. විභේද, නැමිකඳු, මධ්‍යසාගරික වැටි

v. සානු, මධ්‍යසාගරික වැටි, නැමිකඳු (.........)

20. තෘතීයික අවධියට අයත් අවසාදිත පාෂාණයක් වන මයෝසීන හුණුගල් පාෂාණය ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ හැරුණු විට දක්නට ලැබෙන වෙනත් ප්‍රදේශයක් වන්නේ කුමක්ද?

i. එප්පාවල ප්‍රදේශය ii. ගල්ඔය ප්‍රදේශය iii. ආඩිගම ප්‍රදේශය

iv. මහනුවර ප්‍රදේශය v. අකුරුකඩුව ප්‍රදේශය (.........)

21. මානුෂ භූගෝල විද්‍යාව මඟින් මෑතක සිට මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන පාරිසරික බලපෑම් පිළිබඳ අවධානය යොමුකර ඇති බවට වැදගත් සාක්ෂියකි.

i. කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය ii. ආපදා කළමනාකරණය


iii. කාර්මීකරණය පිළිබඳ අධ්‍යයනය iv. නාගරීකරණය පිළිබඳ අධ්‍යයනය

v. සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය (.........)

22. ලෝක ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපාන සාධක අතර මානුෂ සාධකයක් ලෙස වැදගත් වන්නේ මින් කුමක්ද?

i. දේශගුණය ii. භූවිෂමතාවය iii. ජලපහසුකම් iv. නාගරීකරණය v. ස්වභාවික සම්පත් (.........)

23.



i ii iii iv

රූප සටහනේ දැක්වෙන ජනගහන පිරමීඩ අවස්ථාවල පසුවන රටවල් පිළිවෙලින් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. කෙන්යාව, නෝර්වේ, ආජන්ටිනාව, ස්වීඩනය
ii. ඉන්දියාව, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, නෝර්වේ
iii. කෙන්යාව, ඉන්දියාව, ආජන්ටිනාව, ස්වීඩනය
iv. ආජන්ටිනාව, ඉන්දියාව, ස්වීඩනය, ඕස්ට්‍රේලියාව
v. කෙන්යාව, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, ඕස්ට්‍රේලියාව (.........)

24. මන්දපෝෂණය, රෝගාබාධ, ඉහළ ළදරු මරණ, පහළ ආයු අපේක්ෂාව වැනි ලක්ෂණ ඇතුළත් ලෝක ජන සංඛ්‍යාව හා සම්බන්ධ විවාදිතයක් ලෙස හඳුනාගත හැකි වනුයේ මින් කුමක්ද?

i. ජන සංඛ්‍යා ව්‍යාප්ත වීම. ii. ආබාධිත බව iii. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය
iv. දරිද්‍රතාවය v. අවතැන්වීම (.........)

25. එක්සත් ජාතීන්ගේ ජන සංගණන වාර්තාවලට අනුව (2015) සංවර්ධිත රටවල ඉහළ උපත් අනුපාතිකයක් දක්වන රටවල් කාණ්ඩය පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?

i. ජපානය, උතුරු කොරියාව, සිංගප්පූරුව, ඇ.එ. ජනපදය
ii. ජපානය, එක්සත් රාජධානිය, ද. කොරියාව, සිංගප්පූරුව
iii. ද. කොරියාව, ජපානය, සිංගප්පූරුව, ඇ.එ. ජනපදය
iv. ඇ.එ. ජනපදය, ජපානය, සිංගප්පූරුව, ද.කොරියාව
v. ඇ.එ. ජනපදය, එක්සත් රාජධානිය, ද. කොරියාව, සිංගප්පූරුව (.........)

26. ලෝකයේ ජන සංක්‍රමණවල දී ප්‍රභව රටවලට සිදුවන ධනාත්මක ප්‍රතිඵලයක් වන්නේ මින් කුමක්ද?

i. අධි ජනගහන ගැටළුවට පිළියමක් වීම ii. රැකියා ඇබෑර්තු සම්පූර්ණ කිරීමට හැකිවීම.
iii. ආර්ථික වර්ධනය පවත්වාගත හැකි වීම. iv. සංස්කෘතික විවිධත්වයක් ඇති වීම.
v. සංක්‍රමණ ශ්‍රමයට ද බඳුගෙවන නිසා රටට ආදායමක් ලැබීම. (.........)

27. ශ්‍රී ලංකාවේ මිලියනයකට වැඩි ජන සංඛ්‍යාවක් වාසය කරන දිස්ත්‍රික්කයක් වන්නේ මින් කවරක්ද?

i. කෑගල්ල ii අම්පාර iii. කුරුණෑගල iv. නුවරඑළිය v. මාතලේ (.........)

28. ශ්‍රී ලංකාවේ ඉහළ ආකර්ෂණයක් සහිත දිස්ත්‍රික්කය සහ ශුද්ධ සංක්‍රමණ වාර්තාවන දිස්ත්‍රික්කයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර අඩංගු වරණය තෝරන්න.

i. කොළඹ, මාතර ii කොළඹ, කුරුණෑගල iii. ගම්පහ, මහනුවර
iv. ගම්පහ, මාතර v. කොළඹ ගම්පහ (.........)

29. ශ්‍රී ලංකාවේ සමස්ත ග්‍රාමීය ජනගහන ප්‍රතිශතය දැක්වෙනුයේ කවර පිළිතුරේද?

i. 75% ii 80.5% iii. 60.7% iv. 18.2% v. 74.4% (.........)

30. 2050 වන විට ලෝක ජන සංඛ්‍යාවේ 101% වේ යැයි අපේක්ෂා කරන නිර්ණායකය වන්නේ මින් කුමක්ද?

i. ලෝක දරිද්‍රතා දර්ශකය යි. ii ලෝක ආහාර සුරක්ෂිත ප්‍රමාණය
iii. ලෝක ආහාර ශ්‍රම බලකා දර්ශකය iv. ලෝකයේ අවතැන් වූ ප්‍රමාණය
v. ලෝක ව්‍යාපත්වීමේ දර්ශකය (.........)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

22 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018
Second Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................

# භූගෝල විද්‍යාව I

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01). සපයා ඇති 1:50 000 භූ ලක්ෂණ සිතියම් කොටස ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. සිතියම් ප්‍රදේශයේ අංක 1, 2, 3, 4, 5, 6, 7, 8 අංක වලින් දැක්වෙන ලක්ෂණ නම් කරන්න. (ල. 4)

ii. සිතියම් ප්‍රදේශයේ A චතුරස්‍රය තුළ පිහිටි සේවා ස්ථාන 03ක් නම් කරන්න. (ල. 3)

iii. A චතුරස්‍රය දෙගුණයකින් විශාලනය කර විශාලිත චතුරස්‍රය පමණක් අඳින්න. ඒ සඳහා සුදුසු පරිමාණ භාගය දක්වන්න. (ල. 3)

iv. සිතියම් ප්‍රදේශයේ හඳුනාගත හැකි වගාවන් 03ක් නම් කරන්න. (ල. 3)

v. B අක්ෂරයෙන් දැක්වෙන ස්ථානයේ ඇති ලක්ෂණය නම් කරන්න. (ල. 1)

vi. 'ගල්ගමුව නගරය බහු ආගමික නගරයකි' යන ප්‍රකාශයට සිතියම ඇසුරින් හේතු 02ක් දක්වන්න. (ල. 2)

vii. සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන ජනාවාස රටා 02ක් පිළිබඳව කටු සටහන් ඇසුරින් විස්තර කරන්න. (ල. 4)

02). i. 1 : 50000 භූ ලක්ෂණ සිතියම් පත්‍රයක පහත සඳහන් කොටස්වල අන්තර්ගත තොරතුරු 1 බැගින් ලියන්න.

1. ඉහළ වට තීරුව 2. පහළ වට තීරුව 3. ඇතුළු මායිම් තීරුව (ල. 3)

ii. 1 : 50000 භූ ලක්ෂණ සිතියමක මුහුණතෙහි ඇතුළත් ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒවායේ සංකේත නිවැරදි වර්ණ භාවිතා කර ඇඳ දක්වන්න.

| | | | |
|---|---|---|---|
| පළාත් මායිම | තැපැල් කාර්යාලය, | උසාවිය, | මුස්ලිම් පල්ලිය, |
| රෝහල, | පුළුල් ඒකීය දුම්රිය මාර්ගය, | තේ වගාව, | වැව |

(ල. 4)

iii. භූ ලක්ෂණ සිතියම්වල පරිමාණය දක්වා ඇති ක්‍රම 02ක් දක්වා ඒවා ඇඳ දක්වන්න. (ල. 4)


iv. භූ ලක්ෂණ සිතියම්වල භූ විෂමතා ලක්ෂණ නිරූපණය සඳහා යොදා ගන්නා සමෝච්ඡ රේඛාවල ලක්ෂණ 03ක් ලියන්න. (ල. 3)

v. භූ ලක්ෂණ සිතියම් ප්‍රයෝජනයට ගන්නා අවස්ථා තුනක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

03). නවීන තාක්ෂණික ශිල්ප ක්‍රම සිතියම් නිර්මාණයට භාවිතා කිරීමත් සමඟ වර්තමානයේ සිතියම් නිර්මාණ ක්‍රම වෙනස් වී ඇත. ඒ අනුව,

i. වර්තමානයේ සිතියම් නිර්මාණයට භාවිතා කරන නව තාක්ෂණික ක්‍රමවේද තුනක් නම් කරන්න. (ල. 3)

ii. ඔබ ඉහත නම් කල එක් ක්‍රමවේදයක් මඟින් සිතියම් නිර්මාණය හා එහි වාසි පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 6)




iii. භූ ගෝලීය තොරතුරු පද්ධතියක දත්ත ගබඩා කිරීමේ ක්‍රමවේදයක් මෙම රූප සටහනේ දැක්වේ. එම ක්‍රමයෙව්දය නිසා භූගෝලීය තොරතුරු පද්ධතිවලින් සිතියම් නිර්මාණයට හා පරිශීලනයට ඇති වැදගත්කම කරුණු 03ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

iv. භූගෝලීය තොරතුරු පද්ධතියක භාවිතා කරන මූලික සංරචක 02ක් දක්වා ඒවා භාවිතයට ගත හැකි ආකාරයන් පිළිබඳව පැහැදිලි කරන්න. (ල. 5)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 22 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**


විභාග අංකය ..............................  භූගෝල විද්‍යාව II  කාලය පැය තුනයි

**උපදෙස්**

- I හා II කොටස්වලින් ප්‍රශ්න 02 බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

## I කොටස (භෞතික භූගෝල විද්‍යාව)

01).




1. පෘථුවි ජල ගෝලය පද්ධති කිහිපයක් සමඟ සම්බන්ධ වී ඇත. එම පද්ධති අතර ජලය හුවමාරුවන ආකාරය ඉහත රූප සටහනේ දැක්වේ. A, B, C ලෙස දැක්වෙන ජල හුවමාරු සම්බන්ධතා සිදුවන පද්ධති නම් කරන්න. (ල. 3)

2. ඉහත ඔබ නම් කළ A, B, C අවස්ථා ආශ්‍රිත ක්‍රියාවලි පහදන්න. (ල. 6)

3. ජල චක්‍රය කෙටි කාලීනව භූ දර්ශනයට බලපාන ආකාරය පහත සඳහන් කරුණු යටතේ විස්තර කරන්න.

   a. වාෂ්පීකරණය  b. වර්ෂණය (ල. 5)

4. ශ්‍රී ලංකාවේ වියලි කලාපීය ප්‍රදේශවල වර්තමානයේ දී පැන නැගී ඇති පානීය ජල ගැටළුවට ගෙන ඇති නව ක්‍රියාමාර්ග 03ක් සාකච්ඡා කරන්න. (ල. 6)

02). 1. පස නිර්මාණය වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)


2. පාංශු නිර්මාණයට බලපාන පහත දැක්වෙන සාධක පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

i. මව් පාෂාණය ii. දේශගුණය

iii. භූ විෂමතාවය (ල. 6)

3. මෙහි දක්වා ඇති පාංශු පැතිකඩ දැක්වෙන රූප සටහනේ අංක 2 හා 4න් පෙන්නුම් කරන පාංශු මහල් නම් කර අංක 2න් දැක්වෙන පාංශු ස්ථරය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

4. පාංශු සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ කරුණු 03ක් පැහැදිලි කරන්න. (ල. 5)





03). 1. පෘතුවිය මතුපිට දක්නට ලැබෙන විශාලත්වය අනුව භූ රූප වර්ග නම් කරන්න. (ල. 4)

2. අන්තර්ජන්‍ය බලවේගයක් ලෙස සිදුවන යමහල් ක්‍රියාකාරීත්වය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

3. යමහල් භූ රූප 03ක් රූප සටහන් මගින් දක්වා ඒවායේ නිර්මාණාත්මක ක්‍රියාවලිය පිළිබඳ විස්තර කරන්න. (ල. 6)

4. යමහල් ප්‍රදේශ ආශ්‍රිතව නිර්මාණය වන බිම් ආර්ථික වශයෙන් වැදගත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ල. 5)

04).




1. භූ තැටි කාරක කල්පිතයට අනුව ඉහත සිතියමේ දැක්වෙන අංක 1 හා 2න් දැක්වෙන ප්‍රධාන සාගරික තැටි දෙක හා අංක 3 - 4 දැක්වෙන සුළු තැටි දෙක නම් කරන්න. (ල. 4)

2. ප්‍රධාන තැටි මායිම් අතර අභිසාරී තැටි මායිම්වල සිදුවන ක්‍රියාකාරීත්වය සැකෙවින් විස්තර කරන්න. (ල. 6)

3. මධ්‍ය සාගරික වැටි නිර්මාණයේ දී භූ තැටි මායිම් ආසන්නයේ සිදුවන ක්‍රියාකාරීත්වය බලපෑම් කරන ආකාරය පහදන්න. (ල. 4)

4. භූ තැටි චලන ක්‍රියාකාරීත්වය නිසා ඇතිවන පාරිසරික හානි 03ක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 6)

## II කොටස (මානුෂ භූගෝල විද්‍යාව)

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය

05)

| සංගණන වර්ෂය | ජන සංඛ්‍යාව මිලියන | වාර්ෂික වර්ධන සීඝ්‍රතාවය |
|---|---|---|
| 1871 | 2400.4 | |
| 1881 | 2759.8 | 1.4 |
| 1891 | 3007.8 | 0.9 |
| 1901 | 3566.0 | 1.7 |
| 1911 | 4106.4 | 1.4 |
| 1921 | 4497.9 | 0.9 |
| 1931 | 5306.9 | 1.7 |
| 1946 | 6657.3 | 1.5 |
| 1953 | 8097.9 | 2.8 |
| 1963 | 10582.0 | 2.6 |
| 1971 | 12689.9 | 2.2 |
| 1981 | 14846.8 | 1.7 |
| 2001 | 18797.3 | 1.2 |
| 2012 | 20359.4 | 0.7 |

*මූලාශ්‍රයඃ ජන සංඛ්‍යා නිබන්ධය - 2014 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*


1. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ වර්ධනය ඉහත වගුවෙන් දැක්වේ. වගුවට අනුව 1871 සිට 2012 දක්වා කාල වකවානුව තුළ ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන ලක්ෂණ වර්ධන සීඝ්‍රතාවය ඇසුරින් පෙන්වා දෙන්න. (ල. 3)

2. 2001 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ජන සංඛ්‍යා වර්ධන සීඝ්‍රතාවය පහළ වැටීමට බලපා ඇති සාධක කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

3. බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යා වර්ධනය වේගය ඉහළ යාමට බලපාන හේතු තුනක් පැහැදිලි කරන්න. (ල. 5)

4. ජන සංඛ්‍යා වර්ධනය රටෙහි ආර්ථිකයට බලපෑම් කරන ආකාරය කරුණු 03ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

06). ගෝලීය ජන ව්‍යාප්තියට අනුව ලෝකයේ ජනාධික කලාප සපයා පහත සිතියමේ A, B, C, D E අක්ෂර වලින් දැක්වේ.



1. ලෝක සිතියමේ A, B, C, D, E වලින් දැක්වෙන වර්තමාන ජනාධික කලාප පිළිවෙලින් නම් කරන්න. (ල. 4)

2. ඊසාන දිග ඇමෙරිකානු ජන සංකේන්ද්‍රණ කලාපය ප්‍රමුඛ පෙලේ ජනාධික කලාපයක් ලෙස පැවතිණි. වර්තමානයේ අනෙක් කලාප එම කලාපය අභිභවා වර්ධනය වී ඇත. ඊට හේතු දක්වන්න. (ල. 5)

3. රටක ජන සංඛ්‍යාව ඉහළ යාම නිසා මුහුණ දෙන ගැටළු 03ක් සාකච්ඡා කරන්න. (ල. 6)

4. ශ්‍රී ලංකාවේ වයස්ගත ජන සංඛ්‍යාව අධික ලෙස වර්ධනය වෙමින් පවතී. මේ සඳහා බලපාන සාධක 2ක් පැහැදිලි කරන්න. (ල. 5)

07).


1. ලෝක ජන සංඛ්‍යාවේ ගතිකත්වයට බලපාන සාධක 03ක් නම් කරන්න. (ල. 3)

2. සංවර්ධිත රටවලට වඩා සංවර්ධනය වෙමින් පවතින රටවල දළ උපත් අනුපාතිකය පහළ මට්ටමක පැවතීමට හේතු දක්වන්න. (ල. 6)

3. ජාත්‍යන්තර සංක්‍රමණ විවිධ සාධක පදනම් කරගෙන සිදුවේ. එම සාධක 02ක් කෙටියෙන් පහදන්න. (ල. 5)

4. ප්‍රභව රටවල සංක්‍රමණයේ ධනාත්මක හා ඍණාත්මක බලපෑම් මොනවාදැයි විස්තර කරන්න. (ල. 6)

08). ලෝකයේ ජනාවාස ධූරාවලිය පිළිබඳ සටහනක් මෙහි දක්වා ඇත.




1. ඉහත සටහනේ A, B, C, D ලෙස දැක්වෙන ජනාවාස වර්ග නම් කරන්න. (ල. 4)

2. ජනාවාස වල පවතින කාර්යයන් හා ස්වභාවය අනුව වර්ග කළ හැකි ප්‍රධාන ජනාවාස වර්ග 03 කෙටියෙන් හඳුන්වන්න. (ල. 6)

3. ජනාවාස බිහිවීම කෙරෙහි බලපාන මානුෂ සාධක ඉහත ජනාවාස ඇසුරින් පහදන්න. (ල. 6)

4. ලෝකයේ විවිධ රටවල පැවති ජනාවාස වර්තමානය දක්වා විකාශනය වූ ආකාරය විවිධ යුග පදනම් කරගෙන පැහැදිලි කරන්න. (ල. 4)

**දෙවන වාර පරීක්ෂණය - 2018**

# භූගෝල විද්‍යාව I

**12 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 1) | 5 | 11) | 2 | 21) | 2 |
| 2) | 2 | 12) | 3 | 22) | 4 |
| 3) | 4 | 13) | 2 | 23) | 3 |
| 4) | 1 | 14) | 4 | 24) | 4 |
| 5) | 3 | 15) | 2 | 25) | 5 |
| 6) | 3 | 16) | 3 | 26) | 1 |
| 7) | 1 | 17) | 3 | 27) | 3 |
| 8) | 4 | 18) | 4 | 28) | 4 |
| 9) | 2 | 19) | 3 | 29) | 4 |
| 10) | 5 | 20) | 5 | 30) | 5 |

(නිවැරදි පිළිතුරකට ලකුණු 2 බැගින් ලකුණු 60 යි)

## II කොටස

01). i. 1. ගල්තලාව, 2. පුළුල් ඒකීය දුම්රිය මාර්ගය 3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මායිම 4. බෝක්කුව 5. ලඳු කැලෑ 6. වැට 7. රේඛිය ජනාවාස 8. වෙනත් බෝග වගා (ල. 2)

ii. උසවිය, තැපැල් කාර්යාලය, පාසල, රෝහල (ල. 3)

iii. 7.2 cm x 8 cm පරිමාණය 1:25000 (ල. 3)

iv. වී, ගෙවතු, වෙනත් (ල. 3)

v. ජාත්‍යන්තර ඛණ්ඩාංක ඡේදනය වන ස්ථානය (අක්ෂාංශ සහ දේශාංශ) (ල. 2)

vi. පන්සල, ක්‍රිස්තියානි පල්ලිය, මුස්ලිම් පල්ලිය (ල. 2)

vii. රේඛිය, පොකුරු (ආකීර්ණ), විකීර්ණ (ල. 4)

02). i. 1. සිතියම් වර්ගය, සිතියම් ප්‍රදේශයේ නම, පත්‍ර අංකය 2. සූචකය, දිශාව, පරිමාණය ප්‍රක්ෂපණය 3. ගමනාන්ත (මාර්ගවල), කණ්ඩාංක අගය (ල. 3)

ii. නිවැරදි සංකේතවලට ලකුණු ලබා දෙන්න. (ල. 7)

iii. දුඹුරු පාට නිශ්චිත අගයක් ඇත., සමාන උස ඇති ස්ථාන යා කරමින් ඇඳ ඇත. (ල. 3)

iv. අදාල පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න. (ල. 5)

03). i. GPS, GIS, RS (ල. 3)

ii. අදාල පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 5)

iii. දත්ත සංසන්දනය කිරීමේ හැකියාව, විශ්ලේෂණය පහසු වීම, අවශ්‍ය දත්ත පමණක් ලබා ගැනීමේ හැකියාව (ල. 6)

iv. දෘඩාංග, මෘදුකාංග, දත්ත, ක්‍රමවේද, භාවිතා කරන්නන් අදාළ විස්තර කිරීම් සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 5)

**භූගෝල විද්‍යාව II - 12 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය I කොටස**

**භෞතික භූගෝල විද්‍යාව**

01). 1. 1. A – සාගරය හා වැයුගෝලීය අතර ජල හුවමාරුව, B – මතුපිට ජලය හා වායුගෝලය අතර ජල හුවමාරුව

C – මතුපිට ජලය හා භූගත අලය අතර ජල හුවමාරුව (ල. 3)

2. අදාළ පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න. (ල. 6)

3. වර්ෂණයෙක් හා වාෂ්පීකරණයෙන් භූමිය මතුපිටට ඇතිවෙන හානි ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 6)

4. උතුරු මැද හා නැගෙනහිර, වයඹ පළාත් සඳහා මොරගහකන්ද ජලාශය ව්‍යාප්තිය
ජලාශවල ජලය පිරිපහදු කර ජලය බෙදා හැරීම
විශාල වගා ළිං මඟින් ජලය ටැංකි වලට පොම්ප කර පිරිසිදු ජලය නල මඟින් බෙදා ගැනීම. (ල. 6)

02). 1. මවු පාෂාණයේ ජීර්ණය මඟින් ඇතිවෙන ජීර්ණනාවශේෂ සහ ඓන්ද්‍රිය ද්‍රව්‍ය කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක වීම නිසා පස නිර්මාණය වේ. (ල. 4)

2. අදාළ පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 5)

3. 2 - B මහළ 4 - R මහළ

B මහළ - පෝෂිත කලාපයකි. දිරාපත් වූ ඓන්ද්‍රිය හා දිරාපත් වූ ඛනිජ කොටස් ඇත., ලා වර්ණයෙන් යුක්තයි., යකඩ හා ආලුමිනියම් ඛනිජ බහුලයි. (ල. 6)

4. කෘෂිකාර්මික කටයුතුවල දී පසේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට, ස්වාභාවික උපද්‍රව වළක්වා ගැනීමට, ජල සම්පත රැක ගැනීමට. (ල. 5)

03). 1. අදාළ පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 4)

2. පෘතුවි අභ්‍යන්තරයේ මැග්මා දුර්වල කුස්තුර ඔස්සේ ඉහළට විධාරණය වී අභ්‍යන්තරයේ තැම්පත් වීමෙන් අක්‍රාන්ත යමහල් හා මතුපිටට පැමිණ තැම්පත් වීමෙන් නිෂ්ක්‍රාන්ත යමහල් නිර්මාණය වේ. (ල. 4)

3. අක්‍රාන්ත හෝ නිෂ්ක්‍රාන්ත කරුනු 03 ක් විය හැකිය. (ල. 6)

4. සරු පස් කලාප - ඩෙකැන් කපු වගාව, පරානා සානුව, කොපි වගාව
විපරිකරණය වූ නව පාෂාණ, මැණික්, දියමන්ති, කිරිගරුඩ (ල. 6)

04). 1.

| ප්‍රධාන සාගරික තැටි | අප්‍රධාන තැටි | |
|---|---|---|
| 1. ඉන්දු ඕස්ටේලියානු සාගරිකා තැටිය | නස්කා තැටිය | |
| 2. පැසිෆික් සාගරික තැටිය | පිලිපීන තැටිය | (ල. 4) |

2. අභිසාරී වීම් මහද්වීප තැටි සමග මහද්වීප තැටි නැමිකඳු මහද්වීප තැටි, සාගරික තැටි - විභේද ඇතිවෙන ක්‍රියාවලිය පැහැදිලි කිරීම (ල. 6)

3. සාගරික තැටිය දෙපසට අපසාරී වීමේ දී පෘතුවි අභ්‍යන්තරයේ ඇති මැග්මා ඉහළට විධාරණය වී නිර්මාණය වන වැටි සාගරයට මතුපිටින් පසු කාලීනව දිස් වේ. (ල. 4)

4. භූමි කම්පා, සුනාමි, ගිනිකඳු, නාය යෑම්, විස්තර කරන්න. (ල. 6)

## II කොටස - <u>මානුෂ භූගෝල විද්‍යාව</u>

05). 1. 1871 - 1946දක්වා සෙමෙන් වර්ධනය, 1946 - 1971 දක්වා සීඝ්‍ර වර්ධනය,

1971 - 2012 දක්වා සෙමෙන් වර්ධනය (ල. 4)

2. ආර්ථික අපහසුතා, උපත්පාලන ක්‍රම අනුගමනය, කාන්තා උසස් අධ්‍යාපනය,

කාන්තා සේවා නියුක්තිය (ල. 6)

3. රැකියා පහසුකම් නිසා, පදිංචිය සඳහා වැඩි වශයෙන් සංක්‍රමණය වීම. (ල. 6)

4. යහපත් - ශ්‍රම චලනය, සම්පත් වශයෙන් වැදගත් වන දැනුම, ශිල්පීය ඥානය වැදගත් කම
අයහපත් - ඉඩම් හිඟය, රැකියා හිඟය, රැකියා ගැටළු, නිවාස ගැටළු, සුබ සාධන වියදම්. (ල. 4)

06). 1. A - නැගෙනහිර ආසියා B - අග්නිදිග ආසියා C - ද. ආසියාව E - යුරෝපය (ල. 4)

2. අදාළ පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.

සංවර්ධනය නිසා ජන සංඛ්‍යා පාලනය, ආසියාතික රටවල ජන සංඛ්‍යා වර්ධනය (ල. 6)

3. නාගරික ගැටළු, රැකියා ප්‍රශ්නය, ඉඩකඩ ප්‍රශ්නය (ල. 6)

4. සෞඛ්‍ය දියුණුව, යහපත් පෝෂණය, ඉහළ ජීවන තත්ත්වය (ල. 4)

07). 1. ව්‍යාප්තිය, ව්‍යුහය, සංයුතිය, විශාලත්වය, වර්ධනය (ල. 2)

2. වෛද්‍ය විද්‍යාවේ දියුණුව, උපත් පාලන ක්‍රම අනුගමනය, කාන්තාවන්ගේ රැකියා නියුක්තිය, සංවර්ධනයට බාධාවක් ලෙස සැළකීම. (ල. 6)

3. පදිංචිය වෙනස් කිරීම, රැකියා අවස්ථා, දේශපාලන රැකවරණය / සරණාගත, අධ්‍යාපන කටයුතු (ල. 6)

4. **ධනාත්මක** - අධි ජනගහනය විසඳුමකි, සේවා වියුක්තියට ප්‍රතිකර්මයකි, විදේශ විනිමය ඉපැයීම
**සෘණාත්මක** - බුද්ධි පාලනය, ශ්‍රම පාලනය, පවුල් සංස්ථා අර්බුද ඇති වීම. (ල. 6)

08). 1. A – කුඩාගම B – නගරය C – මහනගරය D – නාගරික සමූහිතය (ල. 4)

2. ග්‍රාමීය, නාගරික, ග්‍රාමීය නාගරික ජනාවාසවල ලක්ෂණ හඳුන්වන්න. (ල. 6)

3. යටිතල පහසුකම්, සේවා පහසුකම් ආර්ථික කටයුතු පිළිබඳ හඳුන්වන්න. (ල. 6)

4. දඩයම් යුගය, එඬේර යුගය, කෘෂි යුගය හා කාර්මික විප්ලවයෙන් පසු ජනාවාස විකාශනය පැහැදිලි කරන්න. (ල. 4)